# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2069/38 - 2018 මැයි මස 04 වැනි සිකුරාදා - 2018.05.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2017

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර දීමේ පනත**

1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර දීමේ පනතේ 3(5) වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 10 වන වගන්තිය යටතේ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද සමරසිංහ,
වරාය හා නාවික කටයුතු අමාත්‍ය.

2018 මැයි මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1991 ඔක්තෝබර් මස 17 වන දිනැති අංක 684/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 1991 නැව් නියෝජිතයන්ට (බලපත්‍ර දීමේ) නියෝග, එම නියෝගවල 7 වන නියෝගය පරිච්ඡින්න කොට ඒ වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''7. නැව් නියෝජිතයන්ගේ ලංකා සංගමය විසින් නිර්දේශ කරන ලද සහ වරාය හා නාවික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ගාස්තුවලට අනුව සපයනු ලබන සෑම සේවාවක් සඳහා ම, නැව් නියෝජිතයකු විසින් ප්‍රධානියෙකු වෙතින් යම් ගාස්තුවක් අය කරනු ලැබිය යුතු ය.''

05 - 745

1A - PG 4038 — 507 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*